බෙන්තොට ප්‍රාදේශිය සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු දෙකක් හා සෞඛ්‍ය කම්කරු තනතුරු පුරප්පාඩුවක් සඳහා දෛනික පදනමින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් තිදෙනෙකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2026

බෙන්තොට ප්‍රාදේශිය සභාවේ පුරප්පාඩුව පවතින වැඩ/ක්ෂේත්‍ර කම්කරු පුරප්පාඩු දෙක හා සෞඛ්‍ය කම්කරු තනතුරු පුරප්පාඩුව සඳහා දෛනික පදනමින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් තිදෙනෙකු බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.11.23 දින වේ.

01.බඳවා ගැනීමේ සුදුසුකම්

(අ) අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ආ) යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වයර තුනක් දකුණු පළාතේ බෙන්තොට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
(ඈ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2026/11/23) දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

02. අධ්‍යාපන සුදුසුකම්

(අ) 08 වන ශ්‍රේණිය (09 වසර) සමත් වීම

03. සේවා කොන්දේසි

(අ) මෙය ප්‍රාදේශිය සභාවේ සේවා අවශ්‍යතාවය සැලකිල්ලටගෙන සභා අරමුදලින් වැටුප් හා දීමනා ගෙවීමට යටත්ව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත කරනු ලබන පත්වීමක් වන අතර බෙන්තොට ප්‍රාදේශිය සභාවේ කිසිදු ස්ථිර තනතුරක් සඳහා සුදුසුකම් හිමිවීමක් මෙමගින් සිදු නොවේ.

(ආ) මෙම තනතුරට දෛනික වැටුපක් ගෙවනු ලබන අතර, එය රු. 1,888.76 කි. සේවයේ යෙදුන දිනයන්ට අදාලව වැටුප් ගෙවනු ලබයි.

(ඇ) මෙම සභාවේ මේ වන විටත් සේවයේ යෙදී සිටින සේවකයන් වෙත ප්‍රමුඛත්වය ලබා දෙනු ලබයි.

04. අයදුම් කරුවන්ට පොදු උපදෙස්

- ඉදිරිපත් කර ඇති අයදුම්පත් හා අදාල ලිපි ලේඛන පරීක්ෂාකර බලා මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ඉල්ලුම් කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනේ.
- ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම් කරුවන් මේ සමග පළ කරන ආදර්ශ අයදුම් පත අනුව සකස් කර ගත් අයදුම්පතක් සහතික, ශිෂ්‍ය කාර්යය දර්ශකය, ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය යන ලේඛන වල ඡායා පිටපත් කට්ටලයක් හා පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරි සහතිකය ද සමග 2026/11/23 දින හෝ එයට පෙර *සභාපති, ප්‍රාදේශිය සභාව, බෙන්තොට* යන ලිපිනයට තැපැල මගින් යොමු කිරීම හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.
- අයදුම් පත් භාර ගන්නා අවසන් දිනට පසු තැපැල මගින් හෝ අතින් ගෙනැවින් භාර දෙන අයදුම්පත් නොසලකා හරිනු ලැබේ.
- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර තෝරා ගන්නා අයදුම්කරුවන්ට පමණක් ලිඛිතව ඒ පිළිබඳව දැනුවත් කෙරේ.

ප්‍රේමකුමාර විජේවර්ධන
සභාපති
බෙන්තොට ප්‍රාදේශිය සභාව

සභාපති,
බෙන්තොට ප්‍රාදේශිය සභාව, බෙන්තොට (☎ 034 2275419)